ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2015/10/28 |

## පළාත් දළ දේශීය නිෂ්පාදිතය - 2014

1) ශ්‍රී ලංකා මහ බැංකුවේ සංඛ්‍යාන දෙපාර්තමේන්තුව 2014 වසර සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශිත, 2010 වසර පදනම් වර්ෂය ලෙස සලකා (2010 - ස්ථාවර මිළ ගණන් යටතේ) සකස් කළ දළ දේශීය නිෂ්පාදිත (ද.දේ.නි.) ඇස්තමේන්තු පදනම් කර ගනිමින්,පළාත් දළ දේශීය නිෂ්පාදිතය (ප.ද.දේ.නි.) ගණනය කර ඇත[1].දළ දේශීය නිෂ්පාදිත (ද.දේ.නි.) අගයන්, පළාත් මට්ටමින් සකස්කරගත් දර්ශක පදනම් කොට ගෙන පළාත් මට්ටමට බෙදාහැරීමෙන් පළාත් අනුව දළ දේශීය නිෂ්පාදිතය (ප.ද.දේ.නි.) ගණනය කරන ලදී.

2) 2014 වසරේ දී, ස්ථාවර මිල (මූර්ත අගය) අනුව සියයට 4.5 කින් වර්ධනය වූ දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.) පවත්නා වෙළඳපොළ මිල (නාමික අගය)අනුව රුපියල් බිලියන 10,292 දක්වා සියයට 7.3 කින් වර්ධනය විය. පවත්නා වෙළඳපොළ මිල අනුව ගණනය කළ පළාත් දළ දේශීය නිෂ්පාදිතය සංඛ්‍යා සටහන 1 හි දක්වා ඇත.

---

[1] ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේ පදනම් වර්ෂය 2002 වසරේ සිට 2010 වසර දක්වා සංශෝධනය කර ඇත. ඒ අනුව, ජාතික ගිණුම් ක්‍රමවේදය - 2008 (System of National Accounts 2008) අනුගමනය කරමින්, ජාතික ගිණුම් ගණනය කිරීමේ ක්‍රමවේදයන්ගේ වෙනස්කම් ගණනාවක් සිදුකර ඇත.

**සංඛ්‍යා සටහන 1**

**පළාත් අනුව දළ දේශීය නිෂ්පාදිතය**

**(පවත්නා වෙළඳපොළ මිල අනුව) 2013[(2)]සහ 2014[(3)]**

| පළාත | රුපියල් බිලියන | |
|---|---|---|
| | **2013[(2)]** | **2014[(3)]** |
| බස්නාහිර | 4,078 | 4,320 |
| දකුණු | 1,001 | 1,112 |
| වයඹ | 1,006 | 1,100 |
| මධ්‍යම | 1,005 | 1,073 |
| සබරගමුව | 648 | 689 |
| නැගෙනහිර | 562 | 597 |
| උතුරු මැද | 481 | 523 |
| ඌව | 471 | 511 |
| උතුරු | 339 | 367 |
| **මුළු දිවයින** | **9,592** | **10,292** |

2. සංශෝධිත 3. තාවකාලික


**පළාත් අනුව දළ දේශීය නිෂ්පාදිතය සඳහා දායකත්වය**

3) පළාත් අතර විෂමතාවය අඩුවීමේ මෑත කාලීන ප්‍රවණතාවය තවදුරටත් පෙන්නුම් කරමින් බස්නාහිර පළාතේ ද.දේ.නි. දායකත්වය 2014 වසරේ දී තවදුරටත් අඩු විය. කෙසේ වුවද, පසුගිය වසරවල දී මෙන්ම, 2014 වසරේ දී ද බස්නාහිර පළාත ද.දේ.නි.යට සියයට 42.0 ක දායකත්වයක් ලබාදෙමින් ද.දේ.නි. යට ඉහළම දායකත්වයක් සැපයීය. 2013 වසරේ දී ද.දේ.නි. යට සියයට 10.4 ක දායකත්වයක් දැක්වූ දකුණු පළාත, 2014 වසරේ දී ද.දේ.නි.යට සියයට 10.8 ක දායකත්වයක් දැක්වූ අතර, මෙය පළාත් අනුව ද.දේ.නි.යට දැක්වූ දෙවන විශාලතම දායකත්වය වේ. 2014 වසරේ දී පළාතක් මගින් ද.දේ.නි. යට දැක්වූ තෙවන විශාලතම දායකත්වය (සියයට 10.7) වයඹ **පළාතින් වාර්තා** වූ අතර එම වසරේ දී මධ්‍යම පළාත මගින් ද.දේ.නි. යට දැක්වූ දායකත්වය සියයට 10.4 ක් විය. සබරගමුව හා නැගෙනහිර පළාත් ද.දේ.නි. දායකත්වයන් 2014 වසරේ දී සියයට 0.1 කින් අඩු වූ අතර එම අගයන්

පිළිවෙළින් සියයට 6.7 ක් හා සියයට 5.8 ක් වේ. උතුරු මැද පළාත මගින් ද.දේ.නි. යට 2013 වසරේ දී දැක්වූ සියයට 5.0 ක දායකත්වය 2014 වසරේ දී සියයට 5.1 දක්වා ඉහළ ගොස් ඇත. එසේම, 2013 වසරේ දී සියයට 4.9 ක් ලෙස වාර්තා වූ ඌව පළාත් ද.දේ.නි. දායක්තවය, 2014 දි සියයට 5.0 දක්වා වර්ධනය විය. එමෙන්ම,2013 වසරේ දී සියයට 3.5 ක් ලෙස වාර්තා වූ උතුරු පළාත් ද.දේ.නි. දායකත්වය 2014 වසරේ දී සියයට 3.6 ක් ලෙස වාර්තා විය.

**රූප සටහන 1**

**දළ දේශීය නිෂ්පාදිතයට පළාත් අනුව දායකත්වය**





**පළාත් ද.දේ.නි. යේ වර්ධන අනුපාත**

4) රටෙහි ආර්ථික පරිසරයෙහි වර්ධනයන් පිළිබිඹු කරමින් සියලුම පළාත් ද.දේ.නි. 2014 වසරේ දී සියයට 5.9 සහ සියයට 11.1 අතර යහපත් නාමික වර්ධන අනුපාතයන් වාර්තා කරන ලදී. 2014 වසරේ දී, වාර්තා වූ සියයට 11.1 ක ඉහළම නාමික වර්ධන වේගය දකුණු පළාතින් වාර්තා වූ අතර දෙවන ඉහළම නාමික වර්ධන වේගය වූ සියයට 9.3 ක වර්ධන වේගය වයඹ පළාතින් වාර්තා විය. එමෙන්ම, 2014 වසරේ දී, උතුරු මැද, ඌව හා උතුරු පළාත් පිළිවෙළින් සියයට 8.7, 8.5 හා 8.3 ක වර්ධන වේගයන් අත්පත් කර ගෙන

ඇත. 2014 වසරේ දී බස්නාහිර පළාතින් සියයට 5.9 ක වර්ධන වේගයක් වාර්තා විය.

**රූපසටහන 2**

**පළාත් අනුව නාමික වර්ධන වේගයන් - 2014**




**පළාත් දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික දායකත්වය**

5) පළාත් අනුව ද.දේ.නි. යට දැක්වූ ආංශික දායකත්වය සංඛ්‍යා සටහන 2 හි දක්වා ඇත. මෙමගින්, 2014 වසරේ දී පළාත් අතර ද.දේ.නි. හි සංයුතියේ පෙන්නුම් කළ සැලකිය යුතු වෙනස්කම් මනාව පෙන්නුම් කරයි. 2014 වසරේ දී කෘෂිකර්මාන්ත අංශය, බස්නාහිර පළාතේ ද.දේ.නි. යට සියයට 2.1 ක දායකත්වයක් දක්වන ලද නමුත් අනෙකුත් පළාත්වල එහි දායකත්වය සියයට 11.3 ත් සියයට 17.2 ත් අතර පැවතුණි. මධ්‍යම, දකුණු හා උතුරු මැද පළාත් කෘෂිකාර්මික අංශයෙන් ප.ද.දේ.නි. යට ලබාදුන් දායකත්වය 2014 වසරේ දී වැඩි වී ඇති අතර, අනෙකුත් සියලුම පළාත්වල මෙම දායකත්වය අඩු වී ඇත. උතුරු හා වයඹ පළාත් හැර දිවයිනේ අනෙකුත් සියලු පළාත් කාර්මික අංශයෙන් ප.ද.දේ.නි.යට ලබාදුන් දායකත්වය 2014 වසරේ දී අඩුවීමක් හෝ පැවති මට්ටමේම නොවෙනස්ව පැවතීමක් පෙන්නුම් කරන ලදී. එමෙන්ම,

2014 වසරේ දී ප.ද.දේ.නි.යට කාර්මික අංශයෙන් ලබාදුන් ඉහළම දායකත්වය බස්නාහිර පළාතෙන් ලැබී ඇති අතර, පහළම දායකත්වය ලැබී ඇත්තේ උතුරු පළාතෙනි. 2014 වසරේ දී ද, සේවා අංශය, ප.ද.දේ.නි. යේ ප්‍රමුඛතම තනි අංශයක් ලෙස විවිධ පළාත්වලට අදාළව ප.ද.දේ.නි. යෙන් සියයට 55.2 ත් 67.0 ත් අතර ප්‍රතිශතයක් වාර්තා කළේය. මෙම වසර තුළ දකුණු හා උතුරු පළාත්වල සේවා අංශයෙන් ලැබුණු දායකත්වය ආන්තික අඩුවීමක් වාර්තා කළ නමුත් අනෙකුත් සියලුම පළාත්වල එහි වැඩිවීමක් පෙන්නුම් කරයි.

**සංඛ්‍යා සටහන 2**

**පළාත්වල ද.දේ.නි. සංයුතිය**

| පළාත | කෘෂිකර්මාන්තය | | කර්මාන්ත | | සේවා | |
|---|---|---|---|---|---|---|
| | **2013** | **2014** | **2013** | **2014** | **2013** | **2014** |
| බස්නාහිර | 2.3 | 2.1 | 38.8 | 37.1 | 58.9 | 60.9 |
| මධ්‍යම | 10.0 | 11.3 | 24.9 | 22.9 | 65.1 | 65.9 |
| දකුණු | 12.5 | 13.9 | 27.3 | 26.0 | 60.3 | 60.1 |
| උතුරු | 15.3 | 13.5 | 17.5 | 19.6 | 67.3 | 67.0 |
| නැගෙනහිර | 13.0 | 12.6 | 33.2 | 32.2 | 53.9 | 55.2 |
| වයඹ | 11.8 | 11.3 | 28.9 | 29.0 | 59.3 | 59.7 |
| උතුරු මැද | 13.3 | 13.8 | 23.7 | 21.3 | 63.0 | 64.8 |
| ඌව | 17.7 | 17.2 | 22.1 | 22.1 | 60.2 | 60.6 |
| සබරගමුව | 12.4 | 11.4 | 21.9 | 21.8 | 65.7 | 66.8 |
| **මුළු දිවයින** | **8.2** | **8.3** | **31.3** | **30.1** | **60.5** | **61.7** |